රුහුණ විශ්වවිද්‍යාලය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණපති උපාධි පාඨමාලාව - 2022/2023 අධ්‍යයන වර්ෂය

පළමු සමාසික අවසන් පරීක්ෂණය - ජුනි 2023

## MBM 11023 - කළමනාකරණ ආර්ථික විද්‍යාව

ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හතක් (07) ඇත.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. කාලය : පැය තුනයි.

---

1.

I. "භාණ්ඩයක් මත පනවනු ලබන විකුණුම් බද්දක් අවශ්‍යයෙන්ම බද්දේ මුළු ප්‍රමාණයෙන්ම මිල ඉහළ නොදමයි." රූප සටහන් මාර්ගයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

II. "කාර්යක්ෂම සලාක කිරීමේ ක්‍රමයකින් තොරව ක්‍රියාත්මක කරනු ලබන උපරිම මිල පාලනයකින් භාණ්ඩය සඳහා කළුකඩ වෙළඳපොලක් ඇති කරනු ලබයි." පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

III. පහත සඳහන් කවර සිද්ධීන් ඇමෙරිකාවේ රෙදිපිළි සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දිගේ ගමන් කිරීමට හෝ ඉල්ලුම් වක්‍රයේ විතැන් වීමකට තුඩු දෙන්නේ ද?

(අ.) විදේශ රෙදිපිළි ආනයන කෝටා ඉවත් කිරීම.

(ආ.) ඇමෙරිකාවේ පුරවැසියන්ගේ ආදායම වැඩිවීමක්.

(ඇ.) දේශීය රෙදි නිෂ්පාදන කර්මාන්තයේ පිරිවැය කපා හැරීමක් මිල අඩු කිරීම හරහා වෙළඳපොළ වෙත යොමු කිරීම.

(ලකුණු 03යි)

(මුළු ලකුණු 12 යි)

2.

I. කෙටිකාලයේදී ශ්‍රමයේ ආන්තික ඵලදාව නිරන්තර පහල යාමකට මුහුණ දෙනු ලබන්නේ ඇයි ?

(ලකුණු 04යි)

II. දිගු කාලයේදී ආයතනයක් පළමුව ආර්ථික පිරිමැසුම්වලට සහ අනතුරුව ආර්ථික නොපිරිමැසුම්වලට මුහුණ දෙනු ලබන්නේ කවර හේතූන් නිසාද ?

(ලකුණු 04යි)

III. සම නිෂ්පාදන වක්‍ර විග්‍රහය ආශ්‍රයෙන් ආයතනයක් ප්‍රශස්ත සාධක සංයෝගය (ප්‍රාග්ධනය සහ ශ්‍රමය) තීරණය කිරීමට සම්පූර්ණ කළ යුතු කොන්දේසි පෙන්වා දෙන්න.

(ලකුණු 04යි)

(මුළු ලකුණු 12 යි)

3.

I. කර්මාන්තයේ සියළුම ආයතන දිගු කාලීයේදී ශුන්‍ය ආර්ථික ලාභයක් පමණක් ලබයි. මෙය සත්‍ය වන්නේ ඇයි?

(ලකුණු 05යි)

II. කිසියම් කර්මාන්තයකට අදාළව පහත තොරතුරු ඔබ වෙත දී ඇතැයි සිතමු.

$Q^D = 6500-100P$ (ඉල්ලුම් ශ්‍රිතය)

$Q^S = 1200P$ (සැපයුම් ශ්‍රිතය)

$C = 722 + \frac{Q^2}{200}$ (මුළු පිරිවැය ශ්‍රිතය)

සෑම ආයතනයක්ම සමාන බවක් ගන්නා වූ පූර්ණ තරගකාරී වෙළඳපොළක් යැයි සිතන්න.

(අ.) සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න.

(ආ.) ආයතනය මගින් සපයන ප්‍රමාණය කවරේද? ආයතනයේ ලාභ කවරේ ද?

(ඇ.) දිගුකාලයේදී ආයතන කාර්මාන්තයට ඇතුළු වීමක් හෝ පිටවීමක් ඔබ අපේක්ෂා කරන්නේ ද?

(ලකුණු 07යි)

(මුළු ලකුණු 12 යි)

4.

I. "පූර්ණ තරගකාරී කොන්දේසි යටතේ සම්පත් බෙදා හැරීම සහ නිෂ්පාදනය ඒකාධිකාරී තත්වයකට සාපේෂව වඩාත් කාර්යක්ෂම වෙයි. "පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

II. ඒකාධිකාරයකු විසින් විකුණනු ලබන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් ශ්‍රිතය

$P = 50 - \frac{1}{60}Q$ වේ.

මුළු පිරිවැය ශ්‍රිතය

$TC=100 + 5Q + \frac{1}{480}Q^2$

(අ.) ලාභ උපරිම කරන මිල සහ ප්‍රමාණය කවරේද ?

(ආ.) ආයතනයේ උපරිම ලාභය කවරේද ?

(ලකුණු 04යි)

III. "ඒකාධිකාරී බලය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03යි)

(මුළු ලකුණු 12 යි)

5.

I. පූර්ණ තරගයට සාපේක්ෂව ඒකාධිකාරී තරගය වැඩි කාර්යක්ෂමතාවයක් හෝ අඩු කාර්යක්ෂමතාවයක් පෙන්වන්නේ ද?

(ලකුණු 04යි)

II. කාටල ගිවිසුමකට අනුව ඒක්තරා කාර්මාන්තයක් එහි මිල තීරණය කිරීමේදී ආයතන එකිනෙකා සමග රහස් එකගතාවකට පැමිණීමට අපේක්ෂා කරන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02යි)

III. සුදුසු රූප සටහනක් යොදා ගනිමින් කාටලයක් එහි ඒකාබද්ධ ලාභය උපරිම කරගන්නා අකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 02යි)

IV. ව්‍යාවර්තික ඉල්ලුම් වක්‍රයක් ( Kinked Demand Curve)මගින් මිල දෘඪතාවක් (Price Rigidity) පෙන්වයි. පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(මුළු ලකුණු 12 යි)

6.

I. "මිනිසුන් අවදානම් නොවන විකල්පයකට වඩා අවදානම් විකල්පයක් තෝරා ගන්නේ ද යන්න රඳා පවතින්නේ අවදානම කෙරෙහි ඔවුන්ගේ ආකල්ප සහ විවිධ විකල්පවල අපේක්ෂිත ප්‍රතිලාභ මතයි." අවදානම සම්බන්ධයෙන් ඔවුන්ගේ ආකල්පවලට අනුව හඳුනාගත හැකි කණ්ඩායම් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

II. ප්‍රාග්ධන අයවැයකරණය යන්නේන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03යි)

III. "උද්ධමනයේ ප්‍රතිවිපාක ඉතා ප්‍රබලවන අතර, එය අයවැයකරණයේ සියළුඅංශ කෙරෙහි විවිධ මට්ටමේ තීව්‍රතාවයන්ගෙන් බලපෑම් කරනු ලබයි." ප්‍රාග්ධන අයවැයකරණයට උද්ධමනයේ බලපෑම කෙටියෙන් පැහැදැලි කරන්න.

(ලකුණු 05යි)

(මුළු ලකුණු 12 යි)

7. පහත ඕනෑම තුනකට (03) කෙටි සටහන් ලියන්න.

I. ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක

II. මිල විශේෂීකරතා

III. වෙළඳපොළ අසමත්වීම. (Market Failure)

IV. පූර්ණ කරගකාරී වෙළඳපොළක දිගුකාලීන සැපයුම් වක්‍රය

(මුළු ලකුණු 12 යි)

@@@@@@@@@